ධම්මෝ හවේරක්ඛති ධම්මචාරී

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධාන සාසනං

පිරිත් කියමු. පිරිත් ඇසමු.

පිරිතේ අන්තර්ගතය ජීවිතයට එක්කරමු.

නිරෝගී සුව අත්විඳිමු.

# අන්තර්ගතය

1 . න ම ස් කා ර ය

2 . ප න් සි ල්

3 . ස ත් බු දු න ම ස් කා ර ය

4 . න ව ගු ණ ආ ශි ර් වා ද ය

- අරහං බුදුගුණ ආශිර්වාදය
- සම්මා සම්බුද්ධ බුදුගුණ ආශිර්වාදය
- විජ්ජාචරණසම්පන්න බුදුගුණ ආශිර්වාදය
- සුගත බුදුගුණ ආශිර්වාදය
- ලෝකවිදූ බුදුගුණ ආශිර්වාදය
- අනුත්තර පුරිසදම්මසාරථි බුදුගුණ ආශිර්වාදය
- සත්ථා දේවමනුස්සානං බුදුගුණ ආශිර්වාදය
- බුද්ධ බුදුගුණ ආශිර්වාදය
- භගවා බුදුගුණ ආශිර්වාදය

5 . මහා කස්සපතෙථර බොජ්ඣඞ්ග පිරිත

6 . මහාමොග්ගල්ලානථෙර බොජ්ඣඞ්ග පිරිත

7 . මහා චුන්දතෙථර බොජ්ඣඞ්ග පිරිත

8 . ගිරිමානන්ද සූත්‍රය

9 . බොජ්ඣඞ්ග පිරිත

10. අංගුලිමාල පිරිත

# න ම ස් කා ර ය

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

භාග්‍යවත් වූ අරහත් වූ සම්‍යක් සම්බුදුරජානන් වහන්සේට මාගේ නමස්කාරය වේවා

**බුද්ධං සරණං ගච්ඡාමි**
**ධම්මං සරණං ගච්ඡාමි**
**සංඝං සරණං ගච්ඡාමි**

පළමුව මම බුදුන් සරණ යමි දහම් සරණ යමි සඟුන් සරණ යමි

**දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි**
**දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි**
**දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි**

දෙවනුව ද මම බුදුන් සරණ යමි දහම් සරණ යමි සඟුන් සරණ යමි

**තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි**
**තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි**
**තතියම්පි සංඝං සරණං ගච්ඡාමි**

තෙවනුව ද මම බුදුන් සරණ යමි දහම් සරණ යමි සඟුන් සරණ යමි

# ප න් සි ල්

**පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි**

ප්‍රානගාතයෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

**අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි**

සොරකම් කිරීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

**කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි**

කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

**මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි**

බොරුකීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

**සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි**

සුරා පානයෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදම් වෙමි

# සත්බුදු නමස්කාරය

## විපස්සිස්ස නමත්ථු චක්ඛුමන්තස්ස සිරීමතො
## සිඛිස්සපි නමත්ථු සබ්බභූතානුකම්පිනො
## වෙස්සභුස්ස නමත්ථු නහාතකස්ස තපස්සිනො
## නමත්ථුකකුසන්ධස්ස මාරසේනා පමද්දිනො

ප්‍රඥා ඇත්තා වූ ශ්‍රීමත් වූ විපස්සී නම් බුදුරජු හට නමස්කාරවේවා සියලු සතුන් කෙරෙහි අනුකම්පා
ඇත්තා වූ සිඛි නම් බුදුරජානන් වහන්සේට නමස්කාරවේවා නිර්ක්ලේසී වූ කෙලෙසුන් නසන වීර්‍යය
ඇත්තා වූ වෙස්සභු බුදුරජු හට ද නමස්කාරවේවා පංචවිද මාර සේනාව මර්දනය කලාවූ
කකුසද බුදුරජානන් වහන්සේට ද නමස්කාරවේවා

## කොණාගමනස්ස නමත්ථු බ්‍රාහ්මණස්සවුසීමතො
## කස්සපස්ස නමත්ථු විප්පමුත්තස්ස සබ්බධී
## අඞ්ගීරසස්ස නමත්ථු සක්‍යපුත්තස්ස සිරීමතො
## යො ඉමං ධම්ම මදේසේසි සබ්බදුක්ඛාපනූදනං

බහා තබන ලද පව් ඇති වැස නිමවන ලද මාර්ග බ්‍රහ්මචර්යයා ඇති කෝණාගමන නම් බුදුරජානන්
වහන්සේට නමස්කාරවේවා සියලු කෙලෙසුන් කෙරෙන් විශේෂයෙන් මිදුනාවූ කාශ්‍යප බුදුරජානන්
වහන්සේට ද නමස්කාරවේවා යම් සර්වඥ කෙනෙක් සියලු දුක් දුරුකරන්නාවූ
මේ ධර්මය වදාළසේක් ද අංගීරස නම් වූ
ශ්‍රීමත් වූ ශාක්‍යපුත්‍ර වූ ගෞතම  බුදුරජානන් වහන්සේට නමස්කාරවේවා

## යේ චාපි නිබ්බුතා ලොකේ යතාභූතං විපස්සිසුං
## තෙ ජනා අපිසුණා මහන්තා වීතසාරදා

සත්ව ලෝකයෙහි යම් රහත් කෙනෙක් පිරිනියවියාහු ද තත්වූ පරිද්දෙන් විදර්ශනා කලා වූ ද
ඒ නික්ලේෂී වූ ජනයෝ පෙහෙසුන් වදන් නැත්තාහ මහත් බවට පමිනියා හ පහවූ සංසාර භය
ඇත්තා වූ නොහොත් නිර්භය වූ ඒ රහතන් වහන්සේලාට නමස්කාරවේවා

## හිතං දේව මනුස්සානං යං නමස්සන්ති ගොතමං
## විජ්ජාචරන සම්පන්නං මහන්තං වීතසාරදං

දෙවි මිනිසුන්ට හිත වූ විද්‍යා හා චරණ ධර්මයෙන් සම්පූරණ වූ මහත්වයට පැමිණි
පහවූ සංසාර භය ඇත්තා ව ගෞතමයන් වහන්සේට නමස්කාරනරත් ද
ඒ බුදුරජුන්ට ද ඊට පලමුව සිටි බුදුවරුන්ට ද නමස්කාරවේවා

# න ව ගු ණ ආ ශි ර් වා ද ය

ඉතිපිසෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ
විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ
පුරිසදම්මසාරථී සත්ථාදේවමනුස්සානං බුද්ධෝභගවාති

# අරහං බුදුගුණ ආශිර්වාදය

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ
සියළු රාග-ද්වේෂ-මෝහප්‍රහාණය කළසේක
වීතරාගී වූ සේක, වීතදෝසී වූ සේක, වීතමෝහී වූ සේක
සියළු අකුසල ධර්මයන් ප්‍රහණයකළ සේක,
සියළු කුසල ධර්මයන් උපදවාගත්සේක
සිත කයවචනය පිරිසිදු කළ සේක,අමාමහ නිවන සාක්‍ෂාත්කළ සේක
බුදුරජාණන්වහන්සේ
ඇසින් රූපදැක ඒ රූප කෙරෙහි නොඇළුනසේක, නොගැටුනසේක
මුළා නොවුණසේක,ආශාවදුරුකළසේක
කණින් ශබ්ද අසා ඒ ශබ්ද කෙරෙහි නොඇළුනසේක,
නොගැටුනසේක
මුළා නොවුණසේක,ආශාවදුරුකළසේක
නාසයෙන් ගඳ සුවඳ දැන ඒගඳ සුවඳ කෙරෙහි නොඇළුනසේක
නොගැටුනසේක මුළානොවුණසේක,ආශාවදුරුකළසේක
දිවෙන් රසවිඳ ඒරසය කෙරෙහි නොඇළුනසේක, නොගැටුනසේක
මුළානොවුණසේක,ආශාවදුරුකළ සේක
කයින් පහස ලබා ඒ පහසකෙරෙහි නොඇළුනසේක,නොගැටුනසේක
මුළා නොවුණසේක ආශාවදුරුකළ සේක
මනසින් අරමුණු සිතා ඒ අරමුණුකෙරෙහි
නොඇළුනසේක,නොගැටුනසේක
මුළා නොවුණසේක,ආශාවදුරුකළසේක
රහසින් වත් පව් නොකළසේක

## එහෙයින් අප බුදුරජාණන්වහන්සේ අරහං වනසේක

අරහං නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
අරහං නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
අරහං නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා

# සම්මා සම්බුද්ධ බුදුගුණ ආශිර්වාදය

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ
අවබෝධකළ යුතු වූ දුක නම්වූ ආර්ය සත්‍යය
ගුරු උපදේශනැතිව ම අවබෝධකොට වදාළසේක
ප්‍රහාණයකළ යුතු වූ දුක හටගැනීම නම්වූආර්ය සත්‍යය
ගුරු උපදේශ නැතිව ම ප්‍රහාණයකොට වදාළ සේක
සාක්ෂාත්කළ යුතු වූ දුක නැතිවීම නම්වූ ආර්ය සත්‍යය
ගුරු උපදේශනැතිව ම සාක්ෂාත්කොට වදාළසේක
ප්‍රගුණ කළ යුතු වූ දුක නැතිවීමේ මග නම්වූආර්ය සත්‍යය
ගුරු උපදේශනැතිවම ප්‍රගුණ කොටවදාළ සේක
මෙසේ මේ චතුරාර්ය සත්‍යය ධර්මයන්
සත්‍යඥාණ වශයෙන්ද
කෘත්‍ය ඥාණ වශයෙන්ද
කෘත ඥාණ වශයෙන්ද
පරිවර්ත තුනකින්යුතුව
ආකාර දොළසකින්යුතුව
ගුරු උපදේශනැතිවම අවබෝධකොට වදාළ නිසා

## අප බුදුරජාණන්වහන්සේ සම්මා සම්බුද්ධ වනසේක

සම්මා සම්බුද්ධ නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
සම්මා සම්බුද්ධ නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
සම්මා සම්බුද්ධ නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා

# විජ්ජාචරණසම්පන්න බුදුගුණ ආශිර්වාදය

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ
අහසින්ගමන්කිරීම ජලයේ සක්මන්කිරීම
පොළොවේ කිමිදී වෙනතැනකින් මතුවීම
නොපෙනී ගමන්කිරීම
ආදී අනන්ත ප්‍රාතිහාර්යයන්ගෙන් යුතු
ඍද්ධි ප්‍රාතිහාර්යය ඥණය ලබාගත්සේක
සියළුසත්වයන්ගේ අතීත ජීවිත දැකීමේ හැකියාව වූ
පුබ්බේනිවාසානුස්සති ඥාණය ලබාගත්සේක
සියළු සත්වයන්ගේ සිත්සතන් දැකීමේ හැකියාව වූ
පරචිත්තවිජාණන ඥාණය ලබාගත්සේක
සියළු සත්ත්වයන් කර්මානුරූපව චුතවනආකාරයද
කර්මානුරූපව උපදිනආකාරයද දැකීමේ හැකියාව වූ
චුතූපපාත ඥාණය ලබාගත්සේක
දුර තිබෙන රූපයන් ද ළඟ තිබෙන රූපයන් ද දැකීමේ හැකියාව වූ
දිවැස්නුවණ ලබාගත් සේක
දුරතිබෙන ශබ්දයන්ද ළඟ තිබෙන ශබ්දයන්ද ඇසීමේහැකියාව වූ
දිව්‍යශ්‍රවණඥාණය ලබාගත් සේක
තමන්වහන්සේතුළ පැවති සියළුකෙළෙසුන් සියළු ආස්‍රවයන්
මුළුමනින්ම නැතිකොට ඥාණාලෝකය උපදවාගෙන
ආසවක්ඛයඥාණය ලබාගත්සේක
මෙසේඅනන්ත ඥාණයෙන්ද
අනන්ත ගුණයෙන්ද
අනන්ත සීලයෙන්ද
අනන්ත වීර්යයයෙන්ද
අනන්ත ප්‍රඥාවෙන්ද
අනන්ත සමාධියෙන්ද
සමන්විත නිසා

## අප බුදුරජාණන්වහන්සේ විජ්ජාචරණසම්පන්න වනසේක

විජ්ජාචරණසම්පන්න නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
විජ්ජාචරණසම්පන්න නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
විජ්ජාචරණසම්පන්න නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා

# සුගත බුදුගුණ ආශිර්වාදය

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ
ශෝභන වූ රූප කාය සම්පත්තියක් ඇති හෙයින්
සුන්දර වූ වචන ඇති හෙයින්
සුන්දර වූ ප්‍රතිපත්ති ඇති හෙයින්
ආර්ය මාර්ග සංඛ්‍යාත ශෝභන වූ ගමන් ඇති හෙයින්
සුන්දර වූ ආර්ය අෂ්ටාංගිකමාර්ගය අවබෝධකරගෙන
ඒ මග ගමන්කොට
ඒ අමා මහ නිවනට
පැමිණාවදාළ නිසා

## අප බුදුරජාණන්වහන්සේ සුගත වනසේක

සුගත නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
සුගත නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
සුගත නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා

# ලෝකවිදූ බුදුගුණ ආශිර්වාදය

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ
බිත්තර අස්සේ උපදින සතුන්ගේ ලෝකය ද
මව්කුසින් උපදින සතුන්ගේ ලෝකය ද
තෙත් පරිසරයක හෝ
කුණු වූ මසක උපදින සතුන්ගේ ලෝකය ද
ඉබේපහළ වනසතුන්ගේ ලෝක ද
නම් වූ මෙකී නොකී සියලු
සත්ව ලෝකයන් චතු සත්‍ය වශයෙන්
දැන වදාළ සේක
සියළුබ්‍රහ්ම ලෝක ද
සියළු දිව්‍යලෝක ද
මේ මිනිස්ලෝකය ද
ප්‍රේත ලෝකය ද
සතර අපාය ද
ආදී සියළු අවකාශ ලෝකයන් ද
සංස්කාර ලෝකයන් ද
චතු සත්‍ය වශයෙන්
දැන අවබෝධකොටගෙන
ඒ සියළු ලෝකවලින් නිදහස් හෙයින්

## අප බුදුරජාණන්වහන්සේ ලෝකවිදූ වනසේක

ලෝකවිදූ නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
ලෝකවිදූ නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
ලෝකවිදූ නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා

# අනුත්තර පුරිසදම්මසාරථී බුදුගුණ ආශිර්වාදය

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ
සීල ස්කන්ධයෙන් දෙව් මිනිසුන්ට වැඩි හෙයින් ද
සමාධි ස්කන්ධයෙන් වැඩි හෙයින් ද
ප්‍රඥා ස්කන්ධයෙන් වැඩි හෙයින් ද
විමුක්ති ස්කන්ධයෙන් වැඩි හෙයින් ද
විමුක්ති ඥාණ දර්ශන ස්කන්ධයෙන් වැඩි හෙයින් ද
ඉර්ධි ප්‍රාතිහාර්යයෙන් ද
අනුන්ගේ සිත් දකිමින්
දහම් දෙසීම නම් වූ ආදේශනා ප්‍රාතිහාර්යයෙන් ද
චතුරාර්ය සත්‍යය ධර්මය විස්තර කරන්නා වූ
අනුශාසනා ප්‍රාතිහාර්යයෙන් ද
දමනය කලයුතු යක්ෂ රාක්ෂ තිරිසන් ආදී සත්වයෝ
දමනය කල හෙයින් ද
පින් ඇති දෙව් මිනිසුන්ව දමනය කොට
අමා මහ නිවනට පමුණුවා ලූ හෙයින් ද

## අප බුදුරජාණන් වහන්සේ අනුත්තර පුරිසදම්මසාරථී වන සේක

අනුත්තර පුරිසදම්මසාරථී නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
අනුත්තර පුරිසදම්මසාරථී නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
අනුත්තර පුරිසදම්මසාරථී නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා

# සත්ථා දේවමනුස්සානං බුදුගුණ ආශිර්වාදය

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ
නුවණැති දෙවියන්ට ද
නුවණැති මිනිසුන්ට ද
සසර කතරින් එතෙරවීම පිණිස
මාර්ගය පෙන්වා වදාළසේක

## අප බුදුරජාණන්වහන්සේ සත්ථා දේවමනුස්සානං වන සේක

සත්ථා දේවමනුස්සානං නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
සත්ථා දේවමනුස්සානං නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
සත්ථා දේවමනුස්සානං නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා

# බුද්ධ බුදුගුණ ආශිර්වාදය

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ
දුක්ඛ සත්‍යය අවබෝධ කොට
අන්‍යයන්ට ද අවබෝධ කරවූ සේක
සමුදය සත්‍යය අවබෝධ කොට
අන්‍යයන්ට ද අවබෝධ කරවූ සේක
නිරෝධ සත්‍යය අවබෝධ කොට
අන්‍යයන්ට ද අවබෝධ කරවූ සේක
මාර්ග සත්‍යය අවබෝධ කොට
අන්‍යයන්ට ද අවබෝධ කරවූ සේක
දුක්ඛ සමුදය නිරෝධ මාර්ග
යන චතුරාර්ය සත්‍යයධර්මයන්
අවබෝධ කොට ගෙන
අන්‍යයන්ට ද අවබෝධකරගැනී ම පිණිස
මහා කරුණාවෙන් දේශනාකොට වදාළ සේක
අවබෝධ කරවූ සේක

## අප බුදුරජාණන්වහන්සේ බුද්ධ නං වන සේක

බුද්ධ නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
බුද්ධ නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
බුද්ධ නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා

# භගවා බුදුගුණ ආශිර්වාදය

අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ
මේ සියළු සම්බුදු ගුණ දරාගැනීමට තරම් භාග්‍යවන්ත වනසේක
හිරුසඳ එළිය පරදවන අනන්ත
ආලෝකය විහිදුවන ඥාණාලෝකය
ලබාගැනීමට තරම්භාග්‍යවන්ත වනසේක
මහා කරුණාවෙන් සිසිල්වී ගිය හදමඩලක්
දරාගැනීමට තරම් භාග්‍ය ඇතිසේක
පුණ්‍යභාවයෙන් ද ප්‍රඥාවෙන් ද යසයෙන් ද
ථාමයෙන් ද ඍද්ධියෙන් ද මහත් වූ හෙයින් ද
රාග ද්වේශ මෝහනැසූ හෙයින් ද
ශාන්ත වූ නිර්වානය සාක්ෂාත් කල හෙයින් ද

## අප බුදුරජාණන්වහන්සේ භගවා නම් වනසේක

භගවා නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
භගවා නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා
භගවා නම් වූ බුදුගුණ බලයෙන් සුවපත්වේවා

මෙසේ අනන්ත ගුණ ඇති අනන්ත නුවණ ඇති අනන්ත සිල් ඇති
අනන්ත වීර්යය ඇති අනන්ත ප්‍රඥාඇති අනන්ත විමුක්ති ඇති
බුදුරජාණන්වහන්සේ මම සරණයමි
මාගේ ජීවිතයට බුදුරජාණන්වහන්සේ එකම ආලෝකය වේවා
එකම රැකවරණය වේවා
එකම පිළිසරණ වේවා
එකම සැනසිල්ල වේවා

මේ බුදුගුණයන් ගේ බලයෙන් සුවපත්වේවා
මේ බුදුගුණයන් ගේ බලයෙන් සුවපත්වේවා
මේ බුදුගුණයන් ගේ බලයෙන් සුවපත්වේවා

## සාදු සාදු සාදු

# නවගුණ ආශිර්වාදය

## අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ

අරහං නම් වන සේක
සම්මා සම්බුද්ධ නම් වන සේක
විජ්ජා චරණ සම්පන්න නම් වන සේක
සුගත නම් වන සේක
ලෝකවිදූ නම් වන සේක
අනුත්තරෝ පුරිසදම්ම සාරථී නම් වන සේක
සත්ථා දේව මනුස්සානං නම් වන සේක
බුද්ධ නම් වන සේක
භගවා නම් වන සේක

**මෙසේ අප සම්මා බුදුරජාණන්වහන්සේ**
**නව අරහාදී බුදුගුණයන්ගෙන්**
**සමන්විත වන සේක**

නව අරහාදී බුදුගුණයන්ගේ බලයෙන් සුවපත්වේවා
නව අරහාදී බුදුගුණයන්ගේ බලයෙන් සුවපත්වේවා
නව අරහාදී බුදුගුණයන්ගේ බලයෙන් සුවපත්වේවා

# මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ග පිරිත

ඒවං මේ සුතං ඒකං සමයං භගවා රාජගහේ විහරති
වේළුවනේ කලන්දකනිවාපේ. තේන ඛො පන සමයේන
ආයස්මා මහාකස්සපෝ පිප්ඵලි ගුහායං විහරති ආබාධිකෝ
දුක්ඛිතෝ බාළ්හ ගිලානෝ.

මා විසින් මෙසේ අසන ලදී එකල එක් සමයක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවන
මහා විහාරයේ කලන්දක නිවාප නම් වූ ගිලනුන් සදහා වූ මහා විහාරයේ වැඩ වසන සේක
එ සමයෙහි ආයුෂ්මත් මහා කාශ්‍යප තෙරුන් වහන්සේ පීඩිතව දුකට පත්ව
දැඩි ලෙස ගිලන් ව පිප්ඵලී නම් ගුහාවේ වැඩ වසයි

අථ ඛෝ භගවා සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතෝ,
යේනායස්මා මහා කස්සපෝ තේනුපසඞ්කමි.
උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනේ නිසීදි.
නිසජ්ජ ඛෝ භගවා ආයස්මන්තං මහා කස්සපං ඒතදවෝච.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් යාමයේ ස්වකීය ඵල සමවතින් නැගීසිට මහා කාශ්‍යප ථෙරුන්
වහන්සේ වෙතට එළඹ පැනවූ අසුනේ වැඩ සිටිමින් මහා කාශ්‍යප ථෙරුන් හට මෙසේ වදාල සේක

කච්චි ? තේ කස්සප ඛමනීයං, කච්චි ? යාපනීයං:
කච්චි ? දුක්ඛා වේදනා පටික්කමන්ති නෝ අභික්කමන්ති:
පටික්කමෝසානං පඤ්ඤායති නො අභික්කමෝ ති.

කිමද කාශ්‍යප තොපට ඉවසිය හැකිද කිම තොපට යැපිය හැකිද කිම දුක්ඛ වේදනාවෝ පිරිහෙත්ද
කිම දියුනු නොවෙත්ද එම දුක්ඛ වේදනාවන්ගේ කෙලවරක් පෙනේද වැඩිවීමක් නොපෙනේද යයි
වදාලහ

න මේ භන්තේ ඛමනීයං, න යාපනීයං බාළ්හා මේ දුක්ඛා
වේදනා අභික්කමන්ති නෝ පටික්කමන්ති, අභික්කමෝසානං
පඤ්ඤායති නෝ පටික්කමෝ ති.

ස්වාමින් වහන්ස මට ඉවසිය නොහැක ඉරියව් පවත්වාගත නොහැක මාගේ දුක්ඛ වේදනාවෝ
බලවත්හ දියුනුවක් හෝ අඩුවක් නොමැත දුක්ඛ වේදනාවෝ වැඩිවීමන් මිස අඩුවක් නොපෙනේ

සත්තිමේ කස්සප! බොජ්ක්ඩ්ඩිගා, මයා සම්ම දක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තන්ති, කතමේ සත්ත ?

කාශ්‍යප මේ සප්ත බොජ්කඩ්ඩිග ධර්මයෝ මා විසින් මොනවට ප්‍රකාශ කරන ලදහ භාවිතා කරන ලදහ නැවත නැවත පුහුනුකරන ලදහ සත්‍යය පිණිස මනා අවබෝදය පිණිස ම පවතී මේ කවර බොජ්කඩ්ඩිගයන්ද යත්

සති සම්බොජ්ක්ඩ්ඩිගෝ බෝ කස්සප, මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

කාශ්‍යප සති සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

ධම්මවිචය සම්බොජ්ක්ඩ්ඩිගෝ බෝ කස්සප, මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

කාශ්‍යප ධම්මවිචය  සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

විරිය සම්බොජ්ක්ඩ්ඩිගෝ බෝ කස්සප, මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

කාශ්‍යප විරිය සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

පීති සම්බොජ්ක්ඩ්ඩිගෝ බෝ කස්සප, මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

කාශ්‍යප ප්‍රීති සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද
බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස
මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

පස්සද්ධි සම්බොජ්ඣඞ්ගෝ ඛෝ කස්සප,
මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

කාශ්‍යප පස්සදි සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද
බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස
මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

සමාධි සම්බොජ්ඣඞ්ගෝ ඛෝ කස්සප,
මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

කාශ්‍යප සමාධි සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල
වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස
පවතින්නකි

උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගෝ ඛෝ කස්සප,
මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

කාශ්‍යප උපෙක්ෂා සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන
ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස
මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

ඉමෙ ඛෝ කස්සප සත්ත බොජ්ඣඞ්ගා
මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තන්ති.

කාශ්‍යප මේ සප්ත සම්බොධ්‍යංගයෝ වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන
ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස
මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

තග්ඝ භගවා බොජ්ඣඞ්ගා, තග්ඝ සුගත බොජ්ඣඞ්ගා ති,

භාග්‍යවතුන් වහන්ස බොධ්‍යංග ධර්මයෝ මැනව සුගතයානන් වහන්ස
බොධ්‍යංගයෝ මැනව යි කස්සප තෙරුන් දැන්වූහ

ඉදමවෝච භගවා අත්තමනෝ ආයස්මා මහා කස්සපො
භගවතෝ භාසිතං අභිනන්දි.

භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාල සේක එයින් සතුටු වූ ආයුෂ්මත්
මහා කාශ්‍යප ථෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට කැමතිවිය

වුට්ඨාහිචායස්මා මහා කස්සපො තම්හා ආබාධා,
තථා පහීනෝ චායස්මතො මහා කස්සපස්ස
සෝ ආබාධෝ අහෝසි ති.

ආයුෂ්මත් මහා කාශ්‍යප ථෙරුන් වහන්සේ ඒ ආබාධයෙන් නැගී සිටියේය
උන්වහන්සේගේ ඒ ආබාධය අහෝසිවී පහවී ගියේය

# මහාමොග්ගල්ලානථෙර බොජ්ඣඞ්ග පිරිත

ඒවං මේ සුතං, ඒකං සමයං භගවා රාජගහේ විහරති,
වේළුවනේ කලන්‍දකනිවාපේ, තේන ඛෝපන සමයේන
ආයස්මා මහාමොග්ගල්ලානෝ ගිජ්ඣකූටේ පබ්බතේ
විහරති, ආබාධිකො දුක්ඛිතො බාළ්හ ගිලානෝ.

මා විසින් මෙසේ අසන ලදී එකල එක් සමයක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවන මහා
විහාරයේ කලන්දක නිවාප නම් වූ ගිලනුන් සඳහා වූ මහා විහාරයේ වැඩ වසන සේක
එ සමයෙහි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙරුන් වහන්සේ පීඩිතව දුකට පත්ව
දැඩි ලෙස ගිලන් ව ගිජ්ඣකූට පව්වේ ගුහාවෙක වැඩ වසයි

අථ ඛෝ භගවා සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතෝ,
යේනායස්මා මහාමොග්ගල්ලානෝ තෙනුපසංකමි,
උපසංකමිත්වා පඤ්ඤත්තේ ආසනේ නිසීදි,
නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං
මහාමොග්ගල්ලානං එතදවෝච.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් යාමයේ ස්වකීය ඵල සමවතින් නැගීසිට
මහා මොග්ගල්ලාන ථෙරුන් වහන්සේ වෙතට එළඹ පැනවූ අසුනේ වැඩ සිටිමින්
මහා මොග්ගල්ලාන ථෙරුන් හට මෙසේ වදාල සේක

කච්චි ? තේ මොග්ගල්ලාන ඛමනීයං, කච්චි ? යාපනීයං,
කච්චි ? දුක්ඛා වේදනා පටික්කමන්ති නෝ අභික්කමන්ති.
පටික්කමෝසානං පඤ්ඤායති නො අභික්කමෝ ති.

කිමද මොග්ගල්ලාන තොපට ඉවසිය හැකිද කිම තොපට යැපිය හැකිද කිම දුක්ඛ වේදනාවෝ
පිරිහෙත්ද කිම දියුනු නොවෙත්ද එම දුක්ඛ වේදනාවන්ගේ කෙලවරක් පෙනේද
වැඩිවීමක් නොපෙනේද යයි වදාලහ

න මේ භන්තේ ඛමනීයං න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා
වේදනා අභික්කමන්ති නෝ පටික්කමන්ති, අභික්කමෝසානං
පඤ්ඤායති නෝ පටික්කමෝ ති.

ස්වාමින් වහන්ස මට ඉවසිය නොහැක ඉරියව් පවත්වාගත නොහැක මාගේ දුක්ඛ වේදනාවෝ
බලවත්හ දියුනුවක් හෝ අඩුවක් නොමැත දුක්ඛ වේදනාවෝ වැඩිවීමන් මිස අඩුවක් නොපෙනේ

සත්තිමේ මොග්ගල්ලාන! බොජ්ඣඞ්ගා, මයා සම්ම
දක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය සම්බෝධාය
නිබ්බාණාය සංවත්තන්ති, කතමෙ සත්ත ?

මොග්ගල්ලාන මේ සප්ත බොජඣඞ්ග ධර්මයෝ මා විසින් මොනවට ප්‍රකාශ කරන ලදහ භාවිතා කරන ලදහ නැවත නැවත පුහුනුකරන ලදහ සත්‍යය පිණිස මනා අවබෝදය පිණිස ම පවතී මේ කවර බොජඣඞ්ගයන්ද යත්

සති සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන,
මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

මොග්ගල්ලාන සති සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

ධම්මවිචය සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන,
මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

මොග්ගල්ලාන ධම්මවිචය සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

විරිය සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන,
මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

මොග්ගල්ලාන වීරිය සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

පීති සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන,
මයා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

මොග්ගල්ලාන ප්‍රීති සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

පස්සද්ධි සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන,
මයා සම්මදක්බාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

මොග්ගල්ලාන පස්සදි සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා
කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා
අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

සමාධි සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන,
මයා සම්මදක්බාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

මොග්ගල්ලාන සමාධි සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා
කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා
අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

උපෙක්බා සම්බොජ්ඣඞ්ගෝ බෝ මොග්ගල්ලාන,
මයා සම්මදක්බාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

මොග්ගල්ලාන උපේක්බා සම්බොධ්‍යංගය වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා
කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා
අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

ඉමේ බෝ මොග්ගල්ලාන සත්ත බොජ්ඣඞ්ගා,
මයා සම්මදක්බාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තන්ති.

මොග්ගල්ලාන මේ සප්ත සම්බොධ්‍යංගයෝ වනාහි මා විසින් මොනවට කියන ලද භාවිතා
කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා
අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

තග්ඝ භගව බොජ්ඣඞ්ගා, තග්ඝ සුගත බොජ්ඣඞ්ගා ති,

භාග්‍යවතුන් වහන්ස බොධ්‍යංග ධර්මයෝ මැනව සුගතයානන් වහන්ස බොධ්‍යංගයෝ මැනව යි
මොග්ගල්ලාන තෙරුන් දැන්වූහ

ඉදමවෝච, භගවා, අත්තමනෝ ආයස්මා
මහාමොග්ගල්ලානෝ භගවතෝ භාසිතං අභිනන්දි.

භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාල සේක එයින් සතුටු වූ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන
ථෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට කැමතිවිය

වුට්ඨාහි චායස්මා මහාමොග්ගල්ලානෝ තම්හා ආබාධා,
තථා පහීනෝචායස්මතෝ මහාමොග්ගල්ලානස්ස
සො ආබාධෝ අහෝසි තී.

ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ථෙරුන් වහන්සේ ඒ ආබාධයෙන් නැගී සිටියේය
උන්වහන්සේගේ ඒ ආබාධය අහෝසිවී පහවී ගියේය

# මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ග පිරිත

ඒවං මේ සුතං, ඒකං සමයං භගවා රාජගහේ විහරති
වේළුවනේ කලන්දකනිවාපේ. තේන ඛෝ පන සමයෙන භගවා
ආබාධිකෝ හෝති දුක්ඛිතෝ බාළ්හගිලානෝ.

මා විසින් මෙසේ අසන ලදී එකල එක් සමයක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වේළුවන
මහා විහාරයේ කලන්දක නිවාප නම් වූ ගිලනුන් සඳහා වූ මහා විහාරයේ වැඩ වසන සේක
ඒ සමයෙහි භගවත් තෙමේ පීඩිතව දුකට පත්ව
දැඩි ලෙස ගිලන් වූයේ වෙයි

අථඛෝ ආයස්මා මහාචුන්දෝ සායණ්හසමයං පතිසල්ලානා
වුට්ඨිතෝ, යේනභගවා, තෙනුපසංකමි. උපසංකමිත්වා
භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං
නිසින්නං ඛො ආයස්මන්තං මහාචුන්දං භගවා ඒතදවෝච.
පටිභන්තු තං චුන්ද බොජ්ඣඞ්ගාති.

ඉක්බිති ආයුෂ්යත් මහා චුන්ද තෙමේ සවස් යාමයේ ස්වකීය ඵල සමවතින් නැගීසිට
භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට එළඹ  භාග්‍යවතුන් වහන්සේට වැද
එකත් පස්ව උන්නාහුය එකත් පස්ව උන් ආයුෂ්යත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේට
භාග්‍යවතුන් වහන්සේ මෙය වදාල සේක චුන්දය තොපට බොජ්ඣංග ධර්මයෝ වැටහෙත්වා

සත්තිමේ භන්තේ බොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා
භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය
සංවත්තන්ති. කතමේ සත්ත ?

වහන්ස මේ සප්ත බොජ්ඣඞ්ග ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට
ප්‍රකාශ කරන ලදහ භාවිතා කරන ලදහ නැවත නැවත පුහුනුකරන ලදහ සත්‍යය පිණිස
මනා අවබෝදය පිණිස ම පවතී මේ කවර බොජ්ඣඞ්ගයන්ද යත්

සති සම්බොජ්ඣඞ්ගෝ ඛෝ භන්තේ භගවතා
සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

වහන්ස සති සම්බොධ්‍යංගය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට කියන ලද
භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස
මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

## ධම්මවිචය සම්බොජ්ඣඞ්ගෝ බෝ හන්තේ භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

ධම්මවිචය සම්බොධ්‍යංගය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුණුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

## විරිය සම්බොජ්ඣඞ්ගෝ බෝ හන්තේ, භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

වීරිය සම්බොධ්‍යංගය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුණුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

## පීති සම්බොජ්ඣඞ්ගෝ බෝ හන්තේ, භගවතා සම්මදක්ඛාතො භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

ප්‍රීති සම්බොධ්‍යංගය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුණුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

## පස්සද්ධි සම්බොජ්ඣඞ්ගෝ බෝ හන්තෙ, භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

පස්සදි සම්බොධ්‍යංගය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුණුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

## සමාධි සම්බොජ්ඣඞ්ගෝ බෝ හන්තේ, භගවතා සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

සමාධි සම්බොධ්‍යංගය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට කියන ලද භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුණුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගෝ බෝ භන්තේ, භගවතා
සම්මදක්ඛාතෝ භාවිතෝ බහුලීකතෝ, අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

උපේක්ඛා සම්බොධ්‍යංගය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට කියන ලද භාවිතා
කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස මනා
අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

ඉමේ බෝ භන්තේ සත්ත බොජ්ඣඞ්ගා, භගවතා
සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා. අභිඤ්ඤාය
සම්බෝධාය නිබ්බාණාය සංවත්තන්ති.

මේ සප්ත සම්බොධ්‍යංගයෝ වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට කියන ලද
භාවිතා කරන ලද බහුල වශයෙන් නැවත නැවත පුහුනුකරන ලද සත්‍යය ප්‍රතිවේදය පිණිස
මනා අවබෝදය පිණිස නිවන් පිණිස පවතින්නකි

තග්ඝ චුන්ද බොජ්ඣඞ්ගා, තග්ඝ චුන්ද බොජඣඞ්ගා ති.

චුන්දය බොධ්‍යංග ධර්මයෝ මැනව චුන්දය බොධ්‍යංග ධර්මයෝ ඉතා මැනව

ඉදමවෝචායස්මා මහාචුන්දෝ සමනුඤ්ඤා සත්ථා අහෝසි.
වුට්ඨාහි ච භගවා තම්හා ආබාධා.
තථා පහීනෝච භගවතෝ සෝ ආබාධෝඅහොසී ති.

ආයුෂ්මත් මහා චුන්ද මෙය වදාල සේක සාස්තෲන් වහන්සේ මනාකොට අනුදැන වදාලහ
භාග්‍යවතුන් වහන්සේ ඒ ආබාධයෙන් නැගී සිටි සේක්මය භාග්‍යවතුන් වහන්සේගේ
ඒ ආබාධය අහෝසිවී පහවී ගියේමය

# ගිරිමානන්ද සූත්‍රය

ඒවං මේ සුතං, ඒකං සමයං භගවා සාවත්ථියං විහරති
ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ.
තේන ඛෝ පන සමයේන ආයස්මා ගිරිමානන්දෝ
ආබාධිකෝ හෝති දුක්ඛිතෝ බාළ්හගිලානෝ.

මා විසින් මෙසේ අසන ලදී එකල එක් සමයක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ජේතවනයෙහි
අනාථ පිණ්ඩිකස්ස අනේපිඩු මහා සිටානන්ගේ ආරාමයෙහි වැඩ වසන සේක එ සමයෙහි
ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේ ආබාධිතව දුකට පත්ව දැඩි ලෙස ගිලන් වූයේ වෙයි

අථ ඛෝ ආයස්මා ආනන්දෝ, යේන භගවා තෙනුපසංකමි
උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.
එකමන්තං නිසින්නො ඛො ආයස්මා
ආනන්දෝ භගවන්තං ඒතදවෝච.

ඉක්බිති ආයුෂ්යත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට එළඹ
භාග්‍යවතුන් වහන්සේට වැද එකත් පස්ව උන්නාහුය එකත් පස්ව උන්
ආයුෂ්යත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීහ

ආයස්මා භන්තේ ගිරිමානන්දෝ ආබාධිකෝ දුක්ඛිතෝ
බාළ්හගිලානෝ. සාධු භන්තේ භගවා යෙනායස්මා
ගිරිමානන්දෝ තේනුපසංඛමතු අනුකම්පං උපාදායා ති.

ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේ ආබාධිතව දුකට පත්ව
දැඩි ලෙස ගිලන් වූයේ වෙයි භාග්‍යවතුන් වහන්ස ආයුෂ්මත් ගිරිමානන්ද යම් තැනකද
එතනට අනුකම්පා පිණිස එළඹෙනසේක් නම් මැනවි

සචේ ඛො ත්වං ආනන්ද! ගිරිමානන්දස්ස භික්ඛුනෝ
උපසංකමිත්වා දසසඤ්ඤා භාසෙය්‍යාසි, ඨානං ඛො පනේතං
විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනො දසසඤ්ඤාසුත්වා,
සෝ ආබාධෝ ඨානසෝ පටිපපස්සම්භෙය්‍ය කතමා දස ?

ආනන්දය ඔබ ගිරිමානන්ද භික්ෂුහුගේ සමීපයට එළඹ දශසංඥාවන් කිමදැයි කියන්නේ නම්
මැනවි දශසංඥාවන් අසා ගිරිමානන්ද භික්ෂුහුගේ ඒ ආබාධය වහා සංසිදෙන්නේය
එ රොග සංසිදීමට එය කාරනයක්ද වෙයි මේ දශසංඥාවන් කවරෙක් දැයි යත්

අනිච්ච සඤ්ඤා, අනත්ත සඤ්ඤා, අසුභ සඤ්ඤා,
ආදීනව සඤ්ඤා, පහාණ සඤ්ඤා, විරාග සඤ්ඤා,
නිරෝධ සඤ්ඤා, සබ්බලෝකේ අනභිරත සඤ්ඤා,
සබ්බසංඛාරේසු අනිච්ච සඤ්ඤා, ආනාපාන සති.

අනිත්‍ය සංඥා ය, අනාත්ම සංඥා ය, අසුභ සංඥා ය, ආදීනව සංඥා ය, පහාණ සංඥා ය, විරාගසංඥා ය, නිරෝධ සංඥා ය, සියලු ලෝකයන් හි අනභිරත සංඥා ය, සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥා ය, ආනාපාන සතිය යනුයි.

කතමාචානන්ද අනිච්චසඤ්ඤා ?

ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉතිපටිසංචික්ඛති, රූපං අනිච්චං, වේදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සංඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චන්ති. ඉති ඉමේසු පඤ්චසුපාදානක්ඛන්ධේසු අනිච්චානුපස්සී විහරති.

අයං වුච්චතා නන්ද අනිච්චසඤ්ඤා.

ආනන්දය අනිත්‍ය සංඥා යනු කවරෙක්ද මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ නම් මෙසේ නුවනින් සලකා බලා රූපස්කන්දය අනිත්‍යය වේදනාස්කන්දය අනිත්‍යය සංඥා ස්කන්දය අනිත්‍යය සංකාරාස්කන්දය අනිත්‍යය විඤ්ඤාණස්කන්දය අනිත්‍යය යයි කියති මෙසේ මේ පංච උපාදානස්කන්ධයන් හි අනිත්‍යය ලක්ෂණය නැවත නැවත මෙනෙහිකරමින් වෙසෙයි ආනන්දය මේවා අනිත්‍ය සංඥා යි කියනු ලැබේ

කතමාචානන්ද අනත්තසඤ්ඤා ?

ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉති පටිසංචික්ඛති චක්ඛුං අනත්තා, රූපා අනත්තා, සෝතං අනත්තා, සද්දා අනත්තා, ඝාණං අනත්තා, ගන්ධා අනත්තා, ජිව්හා අනත්තා, රසා අනත්තා, කායෝ අනත්තා, ඵොට්ඨබ්බා අනත්තා, මනෝ අනත්තා, ධම්මා අනත්තා ති.

ඉති ඉමේසු ඡසු අජ්ඣත්තික බාහිරේසු ආයතනේසු අනත්තානුපස්සී විහරති.

අයං වුච්චතා නන්ද අනත්තසඤ්ඤා.

ආනන්දය අනාත්ම සංඥා යනු කවරෙක්ද මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ නම් මෙසේ නුවනින් සලකා බලා ඇස අනාත්මය රූපය අනාත්මය ශබ්දයෝ අනාත්මය නාසය අනාත්මය ගන්ධයෝ අනාත්මය දිව අනාත්මය රසය අනාත්මය කය අනාත්මය ස්පර්ශයෝ අනාත්මය මනස අනාත්මය ධර්මයෝ අනාත්මය යි කියති මෙසේ අධ්‍යාත්මික වූද බාහිර වූද මේ ෂඩ් ආයතනයන් කෙරෙහි අනාත්ම ලක්ෂන දකිමින් වෙසෙයි ආනන්දය මේවා අනාත්ම සංඥා යි කියනු ලැබේ

කතමාචානන්ද අසුභසඤ්ඤා

ඉධා නන්ද භික්ඛු ඉමමේව කායං උද්ධං පාදතලා අධෝ කේසමත්ථකා තච පරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනෝ පච්චවෙක්ඛති.

අත්ථි ඉමස්මිං කායේ, කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ, මංසං, නහාරු, අට්ඨී, අට්ඨිමීඤ්ජා වක්කං, හදයං යකනං, කිලෝමකං පිහකං පප්ඵාසං, අන්තං අන්තගුණං උදරියං කරීසං, පිත්තං සෙම්හං පුබ්බෝ ලොහිතං සේදෝ මේදෝ, අස්සු වසා ඛේලෝ සිඞ්ඝානිකා ලසිකා මුත්තං මත්ථකේ මත්ථලුඞ්ගංතී.

ඉති ඉමස්මිං කායේ අසුභානුපස්සී විහරති.

අයං වුච්චතා නන්ද අසුභසඤ්ඤා ?

ආනන්දය අසුභ සංඥා යනු කවරෙක්ද ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු පත්ලෙන් උඩ කෙස් මතුයෙන් යට සම කෙලවර කොට ඇති මේ ශරීරය නානාප්‍රකාරවූ අසූචියෙන් පිරුනේය යි ප්‍රත්‍යාවේක්ෂා කෙරේද මේ ශරීරයේ කේසයෝ ලෝමයෝ නිය දත් සම මස් නහර ඇට ඇට මිදුලු වකුගඩු හෘදය මාංශ අක්මාව දලබුවය බඩදිව පපුව බඩවැල අතුනුභහනය අමු අහරය මල ය පිත සෙම් ලේ දහඩිය මේද කඳුළු තෙල් කෙල සොටු මූත්‍ර යන දෑ මේ ශරීරයේ ඇත්තාහු යයිද මෙසේ මේ ශරීරයේ ඇත්තාවූ සියල්ලන්ගේ අසුභ බව බලමින් වාසය කරයි ආනන්දය මේවා අසුභ සංඥා යි කියනු ලැබේ

කතමාචානන්ද ආදීනවසඤ්ඤා ?

ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුකඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉතිපටිසංචික්ඛති බහුදුක්ඛෝ ඛෝ අයං කායෝ, බහු ආදීනවෝ, ඉතී ඉමස්මිං කායේ විවිධා ආබාධා උප්පජ්ජන්ති, සෙය්‍යථීදං? චක්ඛුරෝගෝ, සෝතරෝගෝ, ඝාණරෝගෝ, ජීවහාරෝගෝ, කායරෝගෝ, සීසරෝගෝ, කණ්ණරෝගෝ, මුඛරෝගෝ, දන්තරෝගෝ, කාසෝ සාසෝ, පිනාසෝ, ඩහෝ, ජරෝ, කුච්ජිරෝගෝ,

මුච්ඡා, පක්ඛන්දිකා, සූලා, විසූචිකා, කුට්ඨං,ගණ්ඩා, කිලාසෝ, සෝසෝ, අපමාරෝ, දද්දු කණ්ඩු, කච්ඡු, රඛසා, විතච්ඡිකා, ලොහිතපිත්තං මධුමේහෝ, අංසා පිළකා, භගන්දළා.

පිත්තසමුට්ඨානා ආබාධා, සෙම්හ සමුට්ඨානා ආබාධා, වාත සමුට්ඨානා ආබාධා, සන්නිපාතිකා ආබාධා, උතුපරිනාමජා ආබාධා, විසමපරිහාරජා ආබාධා, ඔපක්කමිකා ආබාධා, කම්මවිපාකජා ආබාධා, සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරෝ පස්සාවෝ ති. ඉතිං ඉමසමිං කායේ ආදීනවානුපස්සී විහරති.

අයං වුච්චතා නන්ද ආදීනවසඤ්ඤා ?

ආනන්දය ආදීනව සංඥා යනු කවරෙක්ද මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශුන්‍යාගාරයකට ගියේ හෝ නම් මෙසේ නුවනින් සලකා බලමින් මේ ශරීරය බොහෝ දුක් ඇත්තේ වෙයි බොහෝ ආදීනව ඇත්තේ වෙයි මේ ශරීරය බොහෝ ආබාධයෝ උපදිත් යි සිතයි ඒ කවරෙක්ද යත් ඇස් රෝග සොත රෝග කර්ණ රෝග නාස රෝග දිවේ ඇතිවන රෝග කයෙහි ඇතිවන රෝග හිසෙහි ඇතිවන රෝග කණෙහි ඇතිවන රෝග මුඛයෙහි ඇතිවන රෝග දන්ත රෝග කාස රෝග ස්වාස රෝග පීණස දැවිල්ල උණ උදර රෝග මූර්ජාව අතීසාරය ඉදිමීම කූෂ්ඨ ගඩු රෝග අපස්මාරය දද නිය රෝග පිත මදුමේහය අංශ රෝග පිලිකා පිත සහ පිතෙන් ඇතිවන රෝග සෙම සහ සෙමෙන් ඇතිවන රෝග වාතයෙන් හටගන්නා රෝග තුන් දොසින් වන රෝග
සෘතු පෙරලියෙන් ඇතිවන රෝග විෂම පරිහාරියෙන් ඇතිවන රෝග උපක්‍රමයෙන් ඇතිවන රෝග කර්ම විපාකයන්ගෙන් ඇතිවන රෝග සීත උණ පිපාසය මල මූත්‍රය නිසා වන රෝග ආදී මේ සිරුරෙහි ආදීනව අනුව බලමින් මෙසේ මේ ශරීරයේ ඇත්තාවූ සියල්ලන්ගේ ආදීනව බලමින් වාසය කරයි ආනන්දය මේවා ආදීනව සංඥා යි කියනු ලැබේ

කතමාචානන්ද පහානසඤ්ඤා ?

ඉධා නන්ද භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසේති පජහති විනෝදේති බයන්තිකරෝති අනභාවං ගමේති, උප්පන්නං ව්‍යාපාදවිතක්කං නාධිවාසේති පජහති විනෝදේති බ්‍යන්තිකරෝති අනභාවං ගමේති, උප්පන්නං විහිංසා විතක්කං නාධිවාසේති පජහති විනෝදේති බ්‍යන්තිකරෝති අනභාවං ගමේති, උප්පන්නුප්පන්නේ පාපකේ අකුසලේධම්මේ නාධිවාසේති පජහති විනෝදේති බ්‍යන්තිකරෝති අනභාවං ගමේති.

අයං වුච්චතා නන්ද පහාන සඤ්ඤා

ආනන්දය පහාන සංඥා යනු කවරෙක්ද ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු උපන් කාම විතර්කය නොඉවසත් ද අත්හරී ද දුරු කෙරෙත් ද නැති කෙරෙත් ද

අභාවයට පමුනවාවි ද උපන් ව්‍යාපාද විතර්කය නොඉවසත් ද අත්හරී ද දුරු කෙරෙත් ද නැති කෙරෙත් ද අභාවයට පමුනවාවි ද උපන්නාවූ විහිංසා විතර්කය නොඉවසත් ද අත්හරී ද දුරු කෙරෙත් ද නැති කෙරෙත් ද අභාවයට පමුනවාවි ද උපනුපන් අකුසල ධර්මයන් පව්ටු අකුසල ධර්මයන් නොඉවසත් ද අත්හරී ද දුරු කෙරෙත් ද නැති කෙරෙත් ද අභාවයට පමුනවාවි ද ආනන්දය මේවා පහාණ සංඥා යි කියනු ලැබේ

කතමාචානන්ද විරාග සඤ්ඤා ?
ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉතිපටිසංචික්ඛති ඒතං සන්තං ඒතං පණීතං, යදිදං සබ්බසංඛාර සමතෝ සබ්බුපධීපටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ විරාගෝ නිබ්බාණන්ති.

අයංවුච්චතා නන්ද විරාග සඤ්ඤා.

ආනන්දය විරාග සංඥා යනු කවරෙක්ද මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ නම් මෙසේ නුවනින් සිතයි මේ ශාන්ත මේ ප්‍රනීත මේ සියලු සංස්කාරයන්ගේ සංසිදීම සියලු කෙලෙසුන් සන්සිදීම තෘෂ්ණාව ක්ෂය කිරීම විරාගයට නොඇලීම නිර්වාන්ය යයි ආනන්දය මේවා විරාග සංඥා යි කියනු ලැබේ

කතමාචානන්ද නිරෝධසඤ්ඤා ?

ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා ඉතිපටිසංචික්ඛති ඒතං සන්තං ඒතං පනීතං, යදිදං සබ්බසංඛාර සමතෝ සබ්බුපධී පටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ නිරොධෝ නිබ්බාණන්ති.

අයංවුච්චතා නන්ද නිරෝධසඤ්ඤා.

ආනන්දය විරාග සංඥා යනු කවරෙක්ද ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු ආරණ්‍යගත වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ නම් මෙසේ නුවනින් සිතයි මේ ශාන්ත මේ ප්‍රනීත මේ සියලු සංස්කාරයන්ගේ සංසිදීම කෙලෙසුන් සන්සිදීම තෘෂ්ණාව ක්ෂය කිරීම නිරෝදය නිර්වාන්ය යයි ආනන්දය මේවා නිරෝධ සංඥා යි කියනු ලැබේ

කතමාචානන්ද සබ්බලෝකේ අනභිරත සඤ්ඤා ?

ඉධා නන්ද භික්ඛු යේ ලෝකේ උපායුපාදානා චේතසෝ අධිට්ඨානාභිනිවේසානුසයා තේ පජහන්තෝ විරමති න උපාදියන්තෝ.

අයං වුච්චතා නන්ද සබ්බලෝකේ අනභිරත සඤ්ඤා.

ආනන්දය මුලු ලොව නොඇලීමේ සංඥාව යනු කවරෙක්ද ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු ලෝකයෙහි උපයා ගත් යම් තෘෂ්ණා දෘෂ්ටියක් වේත්ද යම් උපාදානයක් වේත්ද සිත පිලිබඳ පිහිටියාවූ අභිනිවේසයෝ වේත්ද අනුසයෝ නම් පැවති කෙලෙස් වේත්ද ඔවුන් පහ කරමින් නො ගනිමින් නොඇලේද ආනන්දය මේවා සියලු ලොවෙහිම අනභිරත සංඥාව යයි කියනු ලැබේ

කතමාචානන්ද සබ්බසංකාරේසු අනිච්ච සඤ්ඤා ?

ඉධා නන්ද භික්ඛු සබ්බසංකාරේහි අටටීයති
හරායති ජිගුච්ඡති.

අයං වුච්චතා නන්ද සබ්බසංකාරේසු අනිච්ච සඤ්ඤා.

ආනන්දය සියලු සංස්කාර ධර්මයන් හී අනිත්‍ය සංඥාව යනු කවරෙක්ද ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු සියලු සංස්කාර ධර්මයන් කෙරෙන් පීඩාවට පත්වේද ලැජ්ජාවේද පිළිකුල් කෙරේද ආනන්දය මෙය සියලු සංස්කාර ධර්මයන් කෙරෙහි අනිච්ච සංඥාව යයි කියනු ලැබේ

කතමාචානන්ද ආනාපානසති ?

ඉධා නන්ද භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

සෝ සතෝව අස්සසති, සතෝ පස්සසති, දීඝං වා අස්සසන්තෝ දීඝං අස්සසාමී ති පජානාති, දීඝං වා පස්සසන්තෝ දීඝං පස්සසාමීති පජානාති රස්සං වා අස්සසන්තෝ රස්සං අස්සසාමී ති පජානාති; රස්සංවා පස්සසන්තෝ රස්සං පස්සසාමී ති පජානාති; සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමී ති සික්ඛති; සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමී ති සික්ඛති; පස්සම්භයං කාය සංඛාරං අස්සසිස්සාමී ති සික්ඛති; පස්සමභයං කාය සංඛාරං පස්සසිස්සාමී ති සික්ඛති; පීතිපටිසංවෙදී අස්සසිස්සාමී ති සික්ඛති; පීතිපටිසංවෙදී පස්සසිස්සාමී ති සික්ඛති; සුඛපටිසංවේදී අස්සසිස්සාමී ති සික්ඛති; සුඛපටිසංවේදී පස්සසිස්සාමී ති සික්ඛති; චිත්තසංඛාර පටිසංවෙදී අස්සසිස්සාමී ති සික්ඛති; චිත්තසංඛාර පටිසංවෙදී පස්සසිස්සාමී ති සික්ඛති; පස්සම්භයං චිත්තසංඛාරං අස්සසිස්සාමී ති සික්ඛති; පස්සම්භයං චිත්තසංඛාරං පස්සසිස්සාමී ති සික්ඛති; චිත්තපටිසංවේදි අස්සසිස්සාමී ති සික්ඛති; චිත්තපටිසංවේදි පස්සසිස්සාමී ති සික්ඛති;

අභිප්පමෝදයං චිත්තං අස්සසිස්සාමී ති සික්ඛති;
අභිප්පමෝදයං චිත්තං පස්සසිස්සාමී ති සික්ඛති,
සමාදහං චිත්තං අස්සසිස්සාමී ති සික්ඛති; සමාදහං
චිත්තං පස්සසිස්සාමී ති සික්ඛති; විමෝචයං චිත්තං
අස්සසිස්සාමී ති සික්ඛති; විමෝචයං චිත්තං පස්සසිස්සාමී
ති සික්ඛති; අනිච්චානුපස්සී අස්සසිස්සාමී ති සික්ඛති;
අනිච්චානුපස්සී පස්සසිස්සාමී ති සික්ඛති; විරාගානුපස්සී
අස්සසිස්සාමී ති සික්ඛති; විරාගානුපස්සී පස්සසිස්සාමී ති
සික්ඛති; නිරෝධානුපස්සී අස්සසිස්සාමී ති සික්ඛති;
නිරොධානුපස්ස පස්සසිස්සාමී ති සික්ඛති;
පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී ති සික්ඛති;
පටිනිස්සග්ගානුපස්සී
පස්සසිස්සාමී ති සික්ඛති.

අයං වුච්චතා නන්‍ද ආනාපානසති.

ආනන්දය ආනාපාන සතිය යනු කවරෙක්ද ආනන්දය මෙම සස්නෙහි මහන කෙනෙකු
ආරණ්‍යගත වූයේ හෝ රුක්ෂමූලයකට ගියේ හෝ ශුන්‍යාගාරයකට ගියේ හෝ ද පලක් බැද
උඩුකය ඇද නැතිව මනාව පිහිටුවාගෙන අරමුනෙහි සිහිය එළවා හිදියි ද ඒ මහණාතෙම
සිහිඇත්තේමව ආශ්වාස කෙරේද  සිහිඇත්තේමව ප්‍රාශ්වාස කෙරයිද දීර්ඝ කොට
ආශ්වාස කෙරේද දීර්ඝ කොටආශ්වාස කරන බව දනීද දීර්ඝ කොට ප්‍රාශ්වාස කෙරේද
දීර්ඝ කොට ප්‍රාශ්වාස කරන බව දනීද ලඝු කොට ආශ්වාස කෙරේද
ලඝු කොට ආශ්වාස කරන බව දනීද ලඝු කොට ප්‍රාශ්වාස කෙරේද ලඝු කොට
ප්‍රාශ්වාස කරන බව දනීද සකල ආශ්වාස කාලය මුල මැද අග පහළ කරමින් ආශ්වාස
කරමින් හික්මෙයි සකල ප්‍රාශ්වාස කාලය මුල මැද අග පහළ කරමින් ප්‍රාශ්වාස කරමින්
හික්මෙයි  කාය සංස්කාරහ හෙවත් ආශ්වාසය සංසිදුවන්නෙමි ආශ්වාස කෙරෙමි යි හික්මෙයි
කාය සංස්කාරහ හෙවත් ප්‍රාශ්වාසය සංසිදුවන්නෙමි ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි
ප්‍රීතිය විදිමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි ප්‍රීතිය විදිමින් ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි
සුවය විදිමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි සුවය විදිමින් ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි
චිත්තසංකාර විදිමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි චිත්තසංකාර විදිමින් ප්‍රාශ්වාස කෙරෙමි
යි හික්මෙයි සිත දන්නේ ආශ්වාස කෙරෙමි යි හික්මෙයි සිත දන්නේ ප්‍රාශ්වාස කෙරෙමි යි
හික්මෙයි සිත පහන් කරමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි සිත පහන් කරමින් ප්‍රාශ්වාස කෙරෙමි
යි හික්මෙයි සිත අරමුණොහි සමව තබමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි සිත අරමුණොහි
සමව තබමින් ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි නිර්වානයෙන් සිත මුදමින් ආශ්වාස කෙරෙමි
යි හික්මෙයි නිර්වානයෙන් සිත මුදමින් ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි අනිත්‍යානුඅදර්ශී වූවෙමි
ආශ්වාස කෙරෙමි යි හික්මෙයි අනිත්‍යානුඅදර්ශී වූවෙමි ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි
විරාගානුඅදර්ශී වූවෙමි ආශ්වාස කෙරෙමි යි හික්මෙයි විරාගානුඅදර්ශී වූවෙමි ප්‍රාශ්වාස කෙරෙමි යි
හික්මෙයි නිරෝධානුඅදර්ශී වූවෙමි ආශ්වාස කෙරෙමි යි හික්මෙයි නිරෝධානුඅදර්ශී වූවෙමි ප්‍රාශ්වාස
කෙරෙමි යි හික්මෙයි ප්‍රතිනිඃසර්ගානු වූවෙමි ආශ්වාස කෙරෙමි යි හික්මෙයි ප්‍රතිනිඃසර්ගාන
වූවෙමි ප්‍රාශ්වාස කෙරෙමි යි හික්මෙයි ආනන්දය මෙය ආනාපාන සතිය යයි කියනු ලැබේ

සචේ ඛො ත්වං ආනන්ද ගිරිමානන්‍දස්ස භික්ඛුනෝ
උපසංකමිත්වා ඉමා දස සඤ්ඤා භාසෙය්‍යාසි.
ඨානං ඛෝ පනේ තං විජ්ජත, යං ගිරිමානන්‍දස්ස

භික්ඛුනො ඉමා දස සඤ්ඤා සුත්වා
සෝ ආබාධෝ ඨානසෝ පටිප්පස්සම්භෙය්‍යාති.

ආනන්දය ඔබ ගිරිමානන්ද භික්ඛුන් වෙත එළඹ මේ දස සංඥවන් කියන්නෙහි නම් ගිරිමානන්ද
භික්ඛු තෙමේ මේ දස සංඥවන් අසා ඒ ආබාධයන්ගෙන් වහා සංසිදෙන්නේය

අථ ඛෝ ආයස්මා ආනන්දෝ භගවතෝ සන්තිකේ ඉමා දස
සඤ්ඤා උග්ගහෙත්වා යෙනායස්මා ගිරිමානන්දෝ
තෙනුපසංකමි. උපසංකමිත්වා අයස්මතො ගිරිමානන්දස්ස
ඉමා දස සඤ්ඤා අභාසි.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ දස සංඥවන්
උගෙන ආයුෂ්මත් ගිරිමානන්ද භික්ඛුන් යම් තැනකද එතනට එළඹ ආයුෂ්මත් ගිරිමානන්ද
භික්ෂු නමට මේ දස සංඥවන් වදාළේ ය

අථ ඛෝ ආයස්මතෝ ගිරිමානන්දස්ස ඉමා දස සඤ්ඤා
සුත්වා සෝ ආබාධෝ ඨානසෝ පටිප්පස්සම්භි. වුට්ඨාහි
චායස්මා ගිරිමානන්දෝ තම්හා ආබාධා, තථා පහීනෝ ච
පනායස්මතෝ ගිරිමානන්දස්ස සෝ ආබාධෝ අහෝසි ති.

ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂුන්වහන්සේ ඒ ආබාධයෙන් නැගී සිටියේය ආයුෂ්මත් ගිරිමානන්ද
තෙරුන්ගේ
ඒ ආබාධය අහෝසිවී පහවී ගියේමය

# බොජ්ඣඞ්ග පිරිත

සංසාරේ සංසරන්තානං සබ්බ දුක්ඛ විනාසකේ
සත්ත ධම්මෙව බොජ්ඣඞ්ගේ මාරසේනාප්පමද්දිනෝ

සසර ගමන දික්කරමින් සිටින මාර සේනා පරදවමින් සැම දුක් නැසීමට බොජ්ඣංග දහම මැනවි

බුජ්ඣිත්වායේපි මේ සත්තා තිභවා මුත්තාහි උත්තමා
අජාතිං අජරව්‍යාධිං අමතං නිබ්භයං ගතා

මෙම බොජ්ඣංග දහම දැනගත්තෝ උතුම් තුන් ලෙවෙ ජයගෙන රෝග පීඩා බියෙන් තොරව
අමාමහ නිවනින් සැනසේ

ඒවමාදි ගුණෝ පේතං අනේක ගුණ සංඝහං
ඔසධංව ඉමං මන්තං බොජ්ඣඞ්ගං තං භණාමහේ

බෙහෙතකට සමවූ අනේකවූ මෙබදු ගුණයන්ගෙන් සපිරුන මෙම බොජ්ඣංග දහමෙහි පිහිටෙමු

බොජ්ඣඞ්ගෝ සතිසංඛාතෝ ධම්මානං විචයෝ තථා
විරියං පීති පස්සද්ධි බොජ්ඣඞ්ගා ච තතො පරේ

මනා සිහියද දහමේ විසීමද සැනසුම් සිතද විර්‍යය සතුට මැදහත් බව සමාධියද බොජ්ඣංගයෝ වෙති

සමාධුපෙක්ඛා බොජ්ඣඞ්ගා සත්තේ තේ සබ්බදස්සිනා
මුනිනාසම්ම දක්ඛාතා භාවිතා බහුලීකතා

මේ සත් බොජ්ඣංගයෝ මැනවින් දැන අප තථාගත බුදුරජානන් වහන්සේ විසින්
මැනවින් වඩන ලද්දේ මය

සංවත්තන්ති අභිඤ්ඤාය නිබ්බානායච බෝධියා
ඒතෙන සච්ච වජ්ජේන සොත්ථි තේ හෝතු සබ්බදා

මේ සත් බොජ්ඣංග දහමේ බලයෙන් උසස් ඥානය වැඩී යහපත පිණිසවූ උතුම් සම්මා සම්බුදු
ණිර්වානය අවබොද වේවා

එකස්මිං සමයේ නාථෝ මොග්ගල්ලානඤ්ච කස්සපං
ගිලානෙ දුක්ඛිතෙ දිස්වා බොජ්ඣඞ්ගේ සත්ත දේසයි

ආයුශ්මත් මහා කාෂ්ශප මොග්ගල්ලාන ථෙරුන් වහන්සේලා ගිලන් වූ කල්හි අප තථාගත බුදුරජානන්
වහන්සේ විසින් දෙසූ මේ සත් බොජ්ඣංග ධර්මයෝ මැනවි

තේ ච තං අභිනන්දිත්වා රෝගා මුච්චිංසු තංඛණේ
ඒතේන සච්ච වජ්ජේන සොත්ථි තේ හෝතු සබ්බදා

මේ ධර්මයෝ ඇසීමෙන් සියලූ රෝග සැනෙකින් දුරුවී ඔබට නිරන්තර සුවයක් සහ ශාන්තියක්ම වේවා

ඒකදා ධම්ම රාජාපි ගේළඤ්ඤදනා භි පිළිතෝ
චුන්දත්ථරෙන තං යේව භණාපෙත්වාන සාදරං

දිනක අප තථාගත බුදුරජානන් වහන්සේ ගිලන් වූ කල්හි ආයුශ්මත් මහා චුන්ද ථෙරුන් වහන්සේ
විසින් මෙම බොජ්ඣංග ධර්මයෝ දෙසූ සේක

සම්මෝදිත්වා ච ආබාධා තම්හා වුට්ඨාසි ඨානසෝ
එතෙන සච්ච වජ්ජෙන සොත්ථිතේ හෝතු සබ්බදා
පහීණාතෙ ච ආබාධා තිණ්ණන්නම්පි මහේසිනං
මග්ගාහත කිලේසා ච පත්තානුප්පත්ති ධම්මතං

මේ ධර්මයෝ ඇසීමෙන් සතුටු වූ අප තථාගත බුදුරජානන් වහන්සේ සුවපත් වූ බව නම් වූ
සත්‍යයෙන් ඔබට නිරන්තර සුවයක් සහ ශාන්තියක්ම වේවා

ඒතෙන සච්ච වජ්ජෙන සොත්ථිතේ හෝතුසබ්බදා

මේ උතම් පිරිතෙන් ඒ සැබෑ වදනින් සියලූ රෝග සැනෙකින් දුරුවී
ඔබට නිරන්තර සුවයක් සහ ශාන්තියක්ම වේවා

# අංගුලිමාල පිරිත

පරිත්තං යං භණන්තස්ස නිසින්නට්ඨාන ධෝවනං
උදකම්පි විනාසේසි සබ්බමේව පරිස්සයං
සොත්ථිනාගබ්භ වුට්ඨානං යඤ්ච සාධේති තං ඛණෝ
ථේරස්සංගුලිමාලස්ස ලෝක නාථේන භාසිතං
කප්පට්ඨා යි මහාතේජං පරිත්තං තං භණාමහේ

යතෝහං භගිනි අරියාය ජාතියා ජාතෝ නාභිජානාමි
සඤ්චිච්ච පාණං ජීවිතා වොරෝපේතා
තෙන සච්චෙන සොත්ථිතේ හෝතු සොත්ථි ගබ්භස්සාති

සහෝදරිය මම යම් අවස්ථාවක ආර්ය්‍ය ජාතියෙන් උපන්නෙම්ද පැවිදි උපසන් බව
ලැබීද එතැන් සිට දැනුවත්ව ප්‍රානියෙකුගේ දිවි තොර කළ බවක් නොදනිමි
ඒ සත්‍ය වචන බලයෙන් තොපට යහපතක්ම වේවා
දරු ගැබටද සැපතක් ම වේවා

සබ්බීතියො විවජ්ජන්තු සබ්බ රෝගො විනස්සතු
මා තේ භවත්වන්තරායෝ සුඛී දීඝායුකෝ භව

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බදේවතා
සබ්බ බුද්ධානුභාවෙන සදා සොත්ථී භවන්තු තේ

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බදේවතා
සබ්බ ධම්මානුභාවෙන සදා සොත්ථී භවන්තු තේ

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බදෙවතා
සබ්බ සංඝානුභාවෙන සදා සොත්ථී භවන්තු තේ

නක්ඛත්ත යක්ඛ භූතානංපාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවෙන හන්තු තේසං උපද්දවේ

දේවො වස්සතු කාලේන සස්ස සම්පත්ති හෝතු ච
පීතෝ භවතු ලෝකෝච රාජා භවතු ධම්මිකො

★★★

මීගමුවේ කුරන මංගල පාරේ පදිංචි,
ශ්‍රීලාල් සිල්වා මහතා ගේත් ගීතානී සිල්වා මහත්මිය ගේත්
පුතනුවන් උදාර කෞෂල්‍ය ගේත් දියනිය අක්ෂනා උමාදවී ගේත්
සාශානික මෙහෙවරට තුටු පඩුරක් ලෙසින්
සියළු ලෝ වාසීන්ට නීරෝගී
සුව ප්‍රාර්ථනා කරමින්, දහම් පඩුරක් ලෙසින්, හිතමිත්‍රාදීන් විසින්
වර්ෂ 2008 දුරුතු මස 14 වන දින
20 වන විවාහ සංවත්සරය අරමුනුකර, පලමු මුද්‍රණය කරවන ලදී.

★★★

තෙවන මුද්‍රණය වෙසක් මස 4 වන දින.

පිරුවානා පොත් වහන්සේ අනුශාරයෙන් උපුටාගනිමින් සකස්කළේ දේවප්‍රිය සහ ශ්‍යාමලි.
අනුග්‍රහය: පලමු මුද්‍රණය කිත්සිරි, බිම්බා, කීර්ති සහ ශිරෝෂී. දෙවන මුද්‍රණය අසෝකා, නන්දන, ප්‍රියදර්ශනී, සරත්, නිමල් දහනායක සහ ලකී පිලපිටිය,
තෙවන මුද්‍රණය වෛද්‍ය දයාන් රාජපක්ෂ, *Esoft Computer studies (Pvt) Ltd.*